# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business
Development and Underutilized State Resources Development


මගේ අංකය / எனது இல / My No: DSD/HO/CBO/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2020.12.01

**සමෘද්ධි චක්‍රලේඛ :- 2020/12/ප්‍රජාමූල/13/2020/04**

සියළුම ,
දිස්ත්‍රික් ලේකම් / අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශිය ලේකම්වරුන්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශිය ( මුලස්ථාන) සමෘද්ධි කළමණාකරුවන්,
සමෘද්ධි බැකු සමිති කළමණාකරුවන් හා බැංකු කළමණාකරුවන්,
වසම්/ තුලාන් භාර සමෘද්ධි සංවර්ධන නිළධාරින්,
සමෘද්ධි බැංකු සමිති සභාපතිවරුන් හා බැංකු සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රාදේශිය සංවිධාන සභාපතිවරුන් හා ප්‍රජා මූල සංවිධාන සභාපතිවරුන්,

**<u>නිරෝධායන ඇදිරි නිතිය පනවා ඇති ප්‍රදේශවල හා හුදකලා කර ඇති ප්‍රදේශවල සමෘද්ධි සහනාධාර මුදල් ප්‍රජාමූල සංවිධාන මගින් ගෙවීම් කිරිම</u>**

**01. හැදින්වීම**

කොරෝනා වෛරසය ( Covid -19) ශ්‍රී ලංකාවෙන් තුරන් කිරිම සදහා රජය විසින් ගනු ලබන විවිධ වු ක්‍රියා මාර්ග වලට අනුකූලව, නිරෝධායන ඇදිරි නිතිය පනවා ඇති ප්‍රදේශවල හා හුදකලා කර ඇති ප්‍රදේශවල ජීවත් වන සමෘද්ධි සහනාධාරලාභින්ට හිමි මාසික සහනාධාර මුදල්, සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන මගින් ගෙවීම් කිරිමට අදාල වන උපදෙස් හා මගපෙන්වීම් මෙම චක්‍රලේඛය මගින් ලබා දෙනු ඇත.

**02. සමෘද්ධි බැංකුව විසින් සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයේ ඉතිරි කිරිමේ ගිණුමට සහනාධාර මුදල් ප්‍රේෂණය කිරිම.**

2.1 සහනාධාරලාභින්ගේ ඉතිරි කිරිමේ ගිණුම් වලට බැර වී ඇති සමුච්චිත සහනාධාර මුදල් පදනම් කරගෙන රුපියල් 5,000/= ට (පන්දහසකට) නොවැඩි වන මුදලක් ගෙවිම කල හැකි වන පරිදි, සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන මට්ටමින් සහනාධාර නාම ලේඛන සකස් කර ගත යුතුවේ. එම ලේඛනයේ එකතු මුදල් වටිනාකම අනුව පැවරුම් හර/ බැර භාවිතා කර, එක් එක් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ ඉතිරි කිරිම් ගිණුමට “බැර” කර පොදු ලෙජරයේ අදාල පාලන ගිනුමට හා පෞද්ගලික ඉතිරි කිරිමේ ගිණුමට “ හර” කිරිමට කටයුතු කළ යුතුයි.




1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

2.2 ඉහත 2.1 පරිදි කටයුතු කිරීමෙන් පසු, සකස් කල සහනාධාර නාම ලේඛනය සමග අදාල මුදල සමෘද්ධි ප්‍රජා මුල සංවිධානයේ ගරු භාණ්ඩාගාරික හා ගරු සභාපති හෝ ගරු ලේකම් වෙත භාර දීමට කටයුතු කල යුතුය. අදාල මුදල් සමෘද්ධි ප්‍රජා මුල සංවිධානයේ නිළධාරින් වෙත ක්ෂේත්‍රයේදි භාරදීම හෝ සමෘද්ධි බැංකුවේදි භාරදීම, සෞඛ්‍ය හා ආරක්ෂක අංශවල උපදෙස් අනුව තිරණය කිරීමට සමෘද්ධි බැංකුවේ කළමණාකරු වෙත බලය පවරමි.

3. **සමෘද්ධි සහනාධාරලාභින්ට ප්‍රජා මුල සංවිධානය විසින් ක්ෂේත්‍රයේදි සහනාධාර මුදල් ගෙවීම.**

3.1 සමෘද්ධි ප්‍රජා මුල සංවිධානයේ ගරු භාණ්ඩාගාරික සමග ගරු සභාපති හෝ ලේකම් ඇතුළුව විධායක සභිකයින් දෙදෙනෙක් විසින්, සෞඛ්‍ය හා ආරක්ෂක අංශවල උපදෙස් වලට අනුකුලව සමෘද්ධි බැංකුවෙන් භාර ගන්නා ලද මුදල්, සහානාධාරලාභි සාමාජිකයින් වෙත භාර දීමට කටයුතු කළ යුතුයි. සහනාධාර මුදල් සාමාජිකයින් විසින් භාර ගත් බවට තහවුරු කර ගැනිම සඳහා සමෘද්ධි බැංකුව විසින් ලබා දුන් ලේඛනයට අත්සන් ලබා ගත යුතු අතර එසේ අත්සන් ලබා ගැනිමට අපහසු අවස්ථාවලදී පහත සඳහන් විකල්ප ක්‍රම අනුගමනය කළ හැකිය.

1. ලිඛිත තහවුරුවක් ලබා ගෙන, එය සෞඛ්‍ය ආරක්ෂිතව කවරයකට බහාලිම.
2. ජංගම දුරකතනයකට කෙටි පණිවිඩයක් මගින් තහවුරුවක් ලබා ගැනිම.
3. ජංගම දුරකතනයකින් ඡායාරූපයක් ලබා ගැනිම.

3.2 රජය විසින් නිරෝධායන ඇදිරි නිතිය ඉවත් කල පසු හෝ හුදකලා කරන ලද ප්‍රදේශ එම තත්වයෙන් මුදා හැරිමෙන් පසු සහනාධාර මුදල් ගෙවිමට අදාල නාම ලේඛනයට අදාල සමෘද්ධි ප්‍රතිලාභින්ගෙන් මුදල් භාර ගත් බවට අත්සන් ලබා ගෙන එහි මුල් පිටපත සමෘද්ධි බැංකුව වෙත භාර දීමට ප්‍රජා මුල සංවිධානයේ ගරු සභාපති හා භාණ්ඩාගාරික විසින් කටයුතු කළ යුතුවේ.

4. ඉහත ඡේද අංක 02 හා 03 පරිදි කටයුතු කිරිමේදි සමෘද්ධි ප්‍රජා මුල සංවිධානයේ නිළධාරින් සඳහා අවශ්‍ය වන විෂබිජනාශක දියර , මුව ආවරණ හා අත්වැසුම් වැනි සෞඛ්‍ය ආරක්ෂිත ද්‍රව්‍ය අවශ්‍ය පරිදි ලබා දිමට හා එම ස්වෙච්ඡා නිළධාරින්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනිමට අවශ්‍ය විය හැකි "බලය පැවරීමේ ලිපියක්" ලබා දිමට සමෘද්ධි බැංකු කළමණාකරු විසින් කටයුතු කළ යුතුය. සහානාධාර මුදල් ගෙවිමට අදාල නාමලේඛන නිසි පරිදි ආපසු භාර දීමෙන් පසු වියදම් ආවරණය කර ගැනිම සඳහා එක් ප්‍රජා මුල සංවිධානයක් වෙත රු. 2,000/= ක දීමනාවක් ගෙවිමට කටයුතු කළ යුතුවේ.

5. සමෘද්ධි බැංකුවේ නිළධාරින් විසින් ප්‍රජා මුල සංවිධානයේ නිළධාරින් වෙත සහානාධාර ගෙවීම සඳහා අදාල මුදල් ක්ෂේත්‍රයේ භාර දිමේදි රුපියල් 600,000/= ක ( ලක්ෂ හයක) උපරිමයකට යටත්ව හා ප්‍රජා මුල සංවිධානයේ නිළධාරින් විසින් සමෘද්ධි ප්‍රතිලාභින් වෙත සහනාධාර මුදල් ගෙවිමේදි රුපියල් 300,000/= ක (ලක්ෂ තුනක) උපරිමයකට යටත්ව මාර්ගස්ථ මුදල් රක්ෂණ ආවරණය හිමි වේ.

6. සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත සහනාධාර මුදල් ගෙවීමේදී, යම් ප්‍රතිලාභියෙකු වෙත කුමන හෝ හේතුවක් මත සහනාධාර මුදල් ගෙවීමට සතියක කාලයක් තුල නොහැකි වුවහොත් ලිඛිත දැනුම් දීමක් සමග ප්‍රජා මූල සංවිධානයේ ඉතිරි කිරීමේ ගිණුමට නොපමාව තැන්පත් කිරීමට ප්‍රජා මූල සංවිධානයේ ගරු භාණ්ඩාගාරික/ ගරු සභාපති විසින් කටයුතු කල යුතු වේ. පසුව එම මුදල් සමෘද්ධි බැංකුව විසින් නොපමාව අදාල සහනාධාරලාභියාගේ ඉතිරි කිරීමේ ගිණුමට බැර කිරීමට කටයුතු කල යුතු වේ.

7. ඉහත ඡේද අංක 02 පරිදි, සමෘද්ධි බැංකුව විසින් ප්‍රජා මූල සංවිධානයේ ඉතිරි කිරීමේ ගිණුමට සහනාධාර මුදල් ප්‍රේෂණය කිරීමේදීත්, ඡේද අංක 04 පරිදි ප්‍රජා මූල සංවිධානය වෙත රු. 2,000/- දීමනාවක් ලබා දීමේදී හා ඡේද අංක 06 පරිදි ගෙවීමට නොහැකි වූ සහනාධාර මුදල් ආපසු සහනාධාරලාභීන්ගේ ඉතිරි කිරීමේ ගිණුම්වලට බැර කිරීමේදී සිදු කරනු ලබන ගිණුම් සටහන් සඳහා සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය වෙත " නිවේදන ලිපි " ලබා දීමට කටයුතු කළ යුතුය.

8. සමෘද්ධි සහනාධාර මුදල් ප්‍රජා මූල සංවිධානය මගින් හරහා ගෙවීම් කිරීමේ ක්‍රියාවලියට අදාල වන ගණුදෙනු ඇමුණුම් CBO-13/01 පරිදි සටහන් තැබීමට ප්‍රජා මූල සංවිධානය විසින් කටයුතු කළ යුතුය.

9. මේ අවස්ථාවේ රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්වය කළමණාකරණය කිරීමට ඔබ සැම දක්වන සහය අගය කරමි.



ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම් - මුදල් අමාත්‍යාංශය - කා.දැ.ස
02. රාජ්‍ය ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍රමූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ස
03. අධ්‍යක්ෂ - ක්ෂුද්‍ර මූල්‍ය - අ.ක.ස.
04. අධ්‍යක්ෂ - සමාජ ආරක්ෂණ හා සුභසාධන - අ.ක.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.